පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
மாகாணகல்விப்பணிப்பாளர்
Provincial Director of Education
011 2694951

76, ආනන්ද කුමාරස්වාමි
76 ஆனந்தகுமாரசுவாமிமாவத்தைகொழும்பு07
76,Ananda Coomaraswami Mawatha, Colombo 07

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත

மாகாண கல்வித்திணைக்களம் மேல் மாகாணம

Department of Education

දුරකථන පොදු
பொது தொலைபேசி
General Telephone
011 2693893
011 2693895

ෆැක්ස්
தொலைநகல்
Fax
011 2693894 (P.D)
011 2682263 (Admin)
011 2678398 (Planning)
011 2691574 (Chief Acc.)

ඊ-මේල්
மி -அஞ்சல்
E – mail
westedudep@gmail.com

මගේ අංකය: බප/අ.දෙ./අපරි/04/ප්‍රඥාජ
ඔබේ අංකය:
දිනය திகதி Date: 2018.08.

බස්නාහිර පළාතේ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>බස්නාහිර පළාත් සභාවෙන් පිරිනැමෙන අ.පො.ස.(උසස් පෙළ) ප්‍රඥාජනනී ශිෂ්‍යත්ව වැඩ සටහන - 2019</u>**

පාසල්වලින් 2016 අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිට නියමිත සුදුසුකම් සපුරා 2019 වර්ෂයේ අ.පො.ස.(උ.පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත සිසුන්ගෙන් ඉහත ශිෂ්‍යාධාර ප්‍රදානය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සමග ඔබ වෙත යොමු කරනු ලබන අදාළ අයදුම්පත උසස් පෙළ පන්ති පැවැත්වෙන පාසල්වල විදුහල්පතිවරුන් වෙත නොපමාව ලබා දී පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති සිසුන්ගේ අයදුම්පත් විදුහල්පතිවරුන් වෙතින් ඔබ කාර්යාලය වෙත 2018.09.20 වන දිනට ප්‍රථම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එසේ ලබාගත් අයදුම්පත්‍ර කලාප කාර්යාල මට්ටමින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර බලා නියමිත ලකුණු ප්‍රදානය කිරීමෙන් අනතුරුව ලකුණු අනුපිළිවෙලින් සිසුන් 25 දෙනෙකුගෙන් යුත් නාම ලේඛනයක් 2018.10.20 දිනට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. එම ලිපිගොනුව **<u>කලාපය නමින් අ.පො.ස.(උ.පෙළ) ප්‍රඥාජනනී ශිෂ්‍යාධාර වැඩසටහන-2019</u>** ලෙස නම් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිවක් සලකා බලනු නොලබන බව ද කරුණාවෙන් සලකන්න.

අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු, විදුහල්පතිවරයෙක්/ගුරු උපදේශකවරයෙක්, කලාප අධ්‍යාපන කාර්යාලයේ පරිපාලන නිලධාරි යන අය අතුරින් තිදෙනෙක් තෝරා ගත යුතුය.

**<u>ලකුණු ප්‍රදානය කිරීමේ පිළිවෙල:අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා</u>**

1. A - සාමාර්ථය සඳහා ලකුණු - 5
2. B - සාමාර්ථය සඳහා ලකුණු - 4
3. C - සාමාර්ථය සඳහා ලකුණු - 3
4. S - සාමාර්ථය සඳහා ලකුණු - 2

**<u>තරඟ ජයග්‍රහණ : ක්‍රීඩා සෞන්දර්යය හා නව නිර්මාණ</u>**

සමස්ත ලංකා මට්ටම

1 වන ස්ථානය ලකුණු - 5
2 වන ස්ථානය ලකුණු - 3
3 වන ස්ථානය ලකුණු - 2

පළාත් මට්ටම

1 වන ස්ථානය ලකුණු - 4
2 වන ස්ථානය ලකුණු - 2
3 වන ස්ථානය ලකුණු - 1

කලාප මට්ටම

1 වන ස්ථානය ලකුණු - 3
2 වන ස්ථානය ලකුණු - 2
3 වන ස්ථානය ලකුණු - 1

කොට්ඨාස මට්ටම

1 වන ස්ථානය ලකුණු - 2
2 වන ස්ථානය ලකුණු - 1

පාසල් මට්ටම

1 වන ස්ථානය ලකුණු - 1

**<u>සුදුසුකම් :</u>**

1. දෙමව්පියන් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් වීම
2. බස්නාහිර පළාත් සභාවට අයත් පාසලකින් 2015 අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිට පළමු වතාවේදීම අවම වශයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව විෂයන් 06කින් සමත් වී ඉන් විෂයන් තුනකටවත් සම්මාන සාමාර්ථ ලබා තිබීම .
3. සමෘද්ධිලාභී හෝ අනෙකුත් සහනාධාර හිමි පවුලක සාමාජිකයකු විම හෝ මාසික ආදායම රු.5000/= නොඉක්ම වන පවුලක සාමාජිකයකු විම
4. බස්නාහිර පළාතේ පාසලක උසස් පෙළ හදාරමින් සිටීම
5. යහපත් චරිතයකින් යුතු පුද්ගලයකු විම
6. වෙනත් ශිෂ්‍යත්ව ක්‍රමයක් (5 ශ්‍රේණියේ ශිෂ්‍යාධාර, ජනාධිපති අරමුදලින් පිරිනැමෙන ශිෂ්‍යත්ව හා අධ්‍යාපන අමාත්‍යාංශයේ සිසු දිරිය ශිෂ්‍යත්වය, මහින්දෝදය ශිෂ්‍යත්වය) යටතේ ආධාර නොලබන්නකු වීම

03.ශිෂ්‍යත්ව ප්‍රදානයෙන් අනතුරුව වුව ද මෙහි පහත දැක්වෙන හේතු මත ශිෂයත්වය අවලංගු කළ හැකිය.

- ඉහත 06 හි දැක්වෙන වෙනත් ක්‍රමයක් යටතේ ආධාර ලබා ගැනිම
- වෙනත් පළාතක පාසලකට ඇතුල් විම
- අදාළ කාල සීමාව තුල අධ්‍යාපන කටයුතු නතර කිරීම
- විනය විරෝධි හැසිරීම

04.ශිෂ්‍යාධාර ලබා දීම සඳහා සෑම මාසයකම 80%ක් පැමිණීම අපේක්ෂා කරනු ලැබේ. එසේ නොමැති වූ විට එම මාසයේ ශිෂ්‍යාධාර අහිමි වනු ඇත.එහෙත් නොපැණීමට සාධාරණ හේතු ඉදිරිපත් කර තිබේ නම් විදුහල්පතිගේ නිර්දේශය මත ශිෂ්‍යාධාර ලබා ගත හැකිය.

05.අයදුම්කරුගේ පදිංචිය හා පවුලේ ආදායම පිළිබඳව අදාළ ග්‍රාම නිලධාරී විසින් නිර්දේශිත සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් අනිවාර්යයෙන් ම අනුමත කර තිබිය යුතුය. එම ආදායම් වාර්තාවපසුව වෙනස් කර ඇති බවට පෙනී ගියහොත් අනෙකුත් සුදුසුකම් සියල්ලම සම්පූර්ණ කර ඇතත් එම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට සිදු වන බව අවධාරණය කරමි.(බොහෝ අවස්ථාවල ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන නොමැතිව අයදුමපත් යොමු කරන බැවින් ඒ පිළිබඳව ඔබ පෞද්ගලිකව සැලකිලිමත් විය යුතුය.)

06.ඉහත සඳහන් කරුණු පිළිබඳව උසස් පෙළ පන්ති පැවැත්වෙන පාසල්වල විදුහල්පතිවරු මගින් සිසුන් දැනුවත් කර අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයගෙන් මේ සමග එවා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් ලබා ගෙන නියමිත දිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

පි.ශ්‍රී ලාල් නෝනිස්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (බප)

පිටපත් - 01. පළාත් අධ්‍යාපන ලේකම්(බප) - දැ.ගැ.ස.
02.කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - අදාළ විදුහල්පතිවිරුන් දැනුවත් කිරීම සඳහා

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා
ලි.ප. අංකය :
කලාපය :
ලබා ඇති ලකුණු :

ආදර්ශ අයදුම්පත

**<u>බස්නාහිර පළාත් සභාවෙන් පිරිනැමෙන අ.පො.ස.(උ.පෙළ) ප්‍රඥාජනනී ශිෂ්‍යත්ව</u>**
**<u>සඳහා අයදුම්පත්‍රය - 2016 අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල මත</u>**

01. i. නම (මුලකුරු සමග) :...................................................................
ii. මුලකුරුවලින් හැඳින්වෙන නම් :...................................................................
.......................................................................................................................

02. පදිංචිය පිළිබඳ විස්තර
i. ලිපිනය : ..........................................................................................................
.......................................................................................................................
ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ...................................................................
iii. ග්‍රාම නිලධාරී වසම : .......................................................................................

03. i. උපන් දිනය : වර්ෂය......................මාසය ............. දිනය .......................
ii. 2016.12.31 දිනට වයස : අවු. ............ මාස ........... දින ..............

04. අ.පො.ස.(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (පළමුවෙනි වර)

i. වර්ෂය : .......................... ii. විභාග අංකය : .................................................
iii. විභාගයට ඉදිරිපත් වූ පාසල : ...........................................................................
iv. විභාග ප්‍රතිඵල :

| **<u>සමත් වූ විෂයයන්</u>** | | **<u>ලබාගත් සාමාර්ථය</u>** |
|---|---|---|
| i. | ................................ | ............... |
| ii. | ................................ | ............... |
| iii. | ................................ | ................ |
| iv. | ................................ | ................ |
| v. | ................................ | ................ |
| vi. | ................................. | ................ |
| vii. | ................................. | ................. |
| viii. | ................................. | ................. |
| ix. | .................................. | ................. |

තරඟ ජයග්‍රහණ පිළිබඳ විස්තර

| අංශය | ජාතික | පළාත් | කලාප | කොට්ඨාස | පාසල් | ලකුණු |
|---|---|---|---|---|---|---|
| ක්‍රීඩා | 1ස්ථානය | 1 ස්ථානය | 1 ස්ථානය | 1 ස්ථානය | 1 ස්ථානය | |
| | 2 ස්ථානය | 2 ස්ථානය | 2 ස්ථානය | 2 ස්ථානය | - | |
| | 3 ස්ථානය | 3 ස්ථානය | 3 ස්ථානය | - | - | |
| සෞන්දර්යය | 1ස්ථානය | 1ස්ථානය | 1ස්ථානය | 1 ස්ථානය | 1 ස්ථානය | |
| | 2 ස්ථානය | 2 ස්ථානය | 2 ස්ථානය | 2 ස්ථානය | - | |
| | 3 ස්ථානය | 3 ස්ථානය | 3 ස්ථානය | - | - | |
| නව නිර්මාණ | 1ස්ථානය | 1ස්ථානය | 1ස්ථානය | 1 ස්ථානය | 1 ස්ථානය | |
| | 2 ස්ථානය | 2 ස්ථානය | 2 ස්ථානය | 2 ස්ථානය | - | |
| | 3 ස්ථානය | 3 ස්ථානය | 3 ස්ථානය | - | - | |

සැ.යු.-ලකුණු ලබාදිය යුත්තේ එක් අදියරක් සඳහා පමණක් වන අතර උපරිම ලකුණු 10කි.

05. අ.පො.ස.(උ.පෙළ) හදාරන පාසල පිළිබඳ විස්තර

i. පාසලේ නම : ........................................................................................

ii.අධ්‍යාපන කලාපය : ........................................................................

06. ඔබට වෙනත් ශිෂ්‍යත්වයක් හිමිව තිබේ ද ? ..........................................................

එසේ නම් ඒ පිළිබඳ විස්තර : ..............................................................................

...............................................................................................................

07. මව්/පියා/භාරකරුගේ නම : ..........................................................................

ලිපිනය : ...............................................................................................

...............................................................................................................

දුරකථන අංකය : ..................................................(සම්බන්ධ විය හැකි කුමන හෝ දුරකථන අංකයක් සඳහන් කරන්න)

08. පවුලේ මාසික ආදායම : 1රැකියාවෙන්(ඉලක්කමෙන්) රු.....................................

(අකුරෙන්) රු...............................................................

11. වෙනත් (ඉලක්කමෙන්) රු. .....................................

(අකුරෙන්) රු. ...............................................................

09. ඉහත සඳහන් අය මෙම ග්‍රාම නිලධාරි වසමේ පදිංචි බවත් , දක්වා ඇති ආදායම නිවැරදි බවත් , සමෘද්ධිලාභී පවුලක් වන/නොවන බවත් සහතික කරමි.

අනු අත්සන් කරමි.

............................................... ......................................

ග්‍රාම නිලධාරියාගේ අත්සන ප්‍රාදේශීය ලේකම්

අංක ........................... ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

වසම ........................... .......................................

නිල මුද්‍රාව හා දිනය නිල මුද්‍රාව හා දිනය

ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමි. මෙම ශිෂ්‍යාධාර සඳහා මා තෝරා ගනු ලැබුවහොත් බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් මේ පිළිබඳව පනවා ඇති නීති රීති වලට අනුකූලව කටයුතු කරන බවට පොරොන්දු වෙමි. මා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වැරදි බව ඔප්පු වුවහොත් හෝ මේ පිළිබඳව අදාළ නීති රීති වලට පටහැනිව කටයුතු කළ හොත් හෝ මෙම ශිෂ්‍යාධාරය අහිමි වන බවත් , ලබාගන්නා ලද ශිෂ්‍යාධාර මුදල නැවත බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදු වන බවත් දනිමි. 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව , ජනාධිපති අරමුදල මගින් පිරිනැමෙන ශිෂ්‍යත්ව , අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පිරිනැමෙන සිසු දිරිය ශිෂ්‍යත්ව ආධාර සඳහා මා සුදුසුකම් ලබා නොමැති බව ද ප්‍රකාශ කරමි.

..............................................

අයදුම්කරුගේ අත්සන

දිනය :

ඉහත නම සඳහන් වන ශිෂ්‍යයා/ශිෂ්‍යයාව මෙම විදුහලේ ඉගෙනුම ලබන බවත් , අංක 04 යටතේ දක්වා ඇති ප්‍රතිඵල ලබා ඇති බවත් , පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත් , දෙපාර්තමේන්තුව අපේක්ෂා කරන සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

.......................................

දිනය : විදුහල්පතිගේ අත්සන

නිල මුද්‍රාව